# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2486/07 – 2026 අප්‍රේල් මස 27 වැනි සඳුදා – 2026.04.27**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**සමිති ආඥාපනත**

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ වන මම මේ නිවේදනයෙන්:

1) පහත සඳහන් පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් නො. 250/3A, හයිලෙවල් පාර, කිරුළපන, කොළඹ 06 දරන ස්ථානයේ පිහිටි " කලම්බෝ ස්කූල් ඔෆ් සිලෝසොෆි'' නමැති සමිතිය 1891 අංක 16 දරන සමිති ආඥාපනතේ 3(ආ) වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා බලය පවරමි.

I. දර්ශනය ඉගැන්වීම ඉලක්ක කරගෙන පැවැත්වෙන සම්මන්ත්‍රණ, පාඨමාලා, වැඩමුළු ආදිය සංවිධානය කිරීම.

II. දර්ශනය වැනි විෂයක් පිළිබඳව පොදු සමාජ උනන්දුවක් වර්ධනය කිරීමේ වැදගත්කම පෙන්වා දෙන ප්‍රචාරණ වැඩසටහන් සමාජ මාධ්‍ය මෙන්ම සාම්ප්‍රදායික ජනමාධ්‍ය ද යොදාගෙන ආරම්භ කිරීම.

III. දර්ශනය පිළිබඳව සාහිත්‍යයක් සිංහල භාෂාවෙන් ගොඩනැගීමට දායක වීම.

IV. දර්ශනය පිළිබඳව වැඩිවන උනන්දුවක් ඇසුරින් තාර්කිකව හිතන සමාජයක් ඇති කිරීමට දායකත්වයක් ලබා දීම.

V. සමාජ ගැටුම් අඩු කිරීමට සහ සමාජ සහජීවනය වැඩි කිරීමට උපකාර වන ව්‍යවහාරයක් ලෙස දර්ශනය අභ්‍යාස කිරීම.

VI. විද්‍යාත්මක සබුද්ධිකත්වය ප්‍රවර්ධනය කිරීමට දායක විය හැකි අවියක් ලෙස දර්ශනය යොදා ගැනීම.

VII. සිනමාව, දෘශ්‍ය කලාව, වේදිකාව ඇතුළු පොදුවේ කලාව විසින් සිදු කරන දෙයෙහි වටිනාකම වෙනුවෙන් පෙනී සිටින පදනමක් ලෙස දර්ශනය යොදා ගැනීම.

2) ඉහත කී සමිතිය, සමිති ආඥාපනතේ 5(4) වගන්තියේ විධිවිධාන වලින් නිදහස් කරමි.

**වසන්ත සමරසිංහ,**
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා,
සමුපකාර සංවර්ධන අමාත්‍ය.

2026 ක් වූ අප්‍රේල් මස 07 දින,
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය,
නො. 492,
එල් එච් පී ගොඩනැගිල්ල,
ආර් ඒ ද මෙල් මාවත,
කොළඹ 03.

EOG 04 - 0207/1

---

## සමිති ආඥාපනත

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ වන මම මේ නිවේදනයෙන්:

1) පහත සඳහන් පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් කොළඹ 10, රීජන්ට් වීදිය, අංක 93 හෙද නිල නිවස, කාමර අංක 123 දරන ස්ථානයේ පිහිටි "ද ශ්‍රී ලංකා නර්සස් ඇසෝසියේෂන්" නමැති සමිතිය 1891 අංක 16 දරන සමිති ආඥාපනතේ 3(ආ) වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා බලය පවරමි.

i. ශ්‍රී ලංකාවේ ජනතා සෞඛ්‍ය අවශ්‍යතා අනුව හෙද සේවාව සංවර්ධනය කිරීම.
ii. ජනතාව අතර හෙද සේවාවේ ප්‍රතිරූපය ඉහල නංවාලීම.
iii. හෙද නිලධාරීන් අතර වෘත්තීය අධ්‍යාපනය දියුණු කිරීම.
iv. හෙද නිලධාරීන් අතර උසස් ආචාරශීලි පැවැත්මක් ඇති කිරීම.
v. ශ්‍රී ලංකාවේ හෙද සේවාව හා ජාත්‍යන්තර හෙද සේවාවන් සමග සබඳතා වැඩිදියුණු කිරීම.
vi. හෙද සේවාව හා හෙද අධ්‍යාපනය සඳහා ප්‍රමිතීන් සකස් කිරීම.
vii. හෙද නිලධාරීන්ගේ සමාජ, ආර්ථික මට්ටම ඉහල නංවාලීම සඳහා කටයුතු කිරීම.
viii. හෙද නිලධාරීන්ගේ තත්වය හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා දියුණු කිරීම.

2) ඉහත කී සමිතිය, සමිති ආඥාපනතේ 5(4) වගන්තියේ විධිවිධාන වලින් නිදහස් කරමි.

**වසන්ත සමරසිංහ,**
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා,
සමුපකාර සංවර්ධන අමාත්‍ය.

2026 ක් වූ අප්‍රේල් මස 07 දින,
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය,
නො. 492,
එල් එච් පී ගොඩනැගිල්ල,
ආර් ඒ ද මෙල් මාවත,
කොළඹ 03.

EOG 04 - 0207/2

## සමිති ආඥාපනත

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ වන මම මේ නිවේදනයෙන්:

1). පහත සඳහන් පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් කටුනායක, ඇවරිවත්ත, බෙස්ලයින් පාර, නො. 05 දරන ස්ථානයේ පිහිටි ''ශ්‍රී ලංකා ප්‍රමිතිගත ජල බෝතල් සංගමය'' නමැති සමිතිය 1891 අංක 16 දරන සමිති ආඥාපනතේ 3(ආ) වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා බලය පවරමි.

i. පානීය ජල බොතල් නිෂ්පාදන කර්මාන්තයට අදාළ සියළුම සාමාජික මහතුන්ගේ චිරස්ථිතිය සහ අභිවෘද්ධිය වෙනුවෙන් සහ කර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් කටයුතු කිරීම සඳහා සාමූහික තීරණ ගැනීම බලගැන්වීම හා ක්‍රියාත්මක කිරීම.

ii. කර්මාන්තයේ සාධනීය වශයෙන් ධනාත්මක අගයක ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගැනීම සඳහා කටයුතු කිරීම.

iii. මුළු කර්මාන්තයෙහි මෙම සමස්ත ප්‍රමිතිගත ක්‍රියාවලිය අන්තර් ජාතික ඇගයීමකට ලක් කළ හැකි ලෙස උසස් තත්වයෙන් පවත්වා ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය පාලිත ක්‍රමවේදයන්ට සහ අනෙකුත් නියමන ක්‍රියාවලින්ට ඍජුව මැදිහත්වීම මගින් තත්වයෙන් උසස් කර්මාන්තයක් බිහි කිරීම සඳහා මැදිහත්වීම.

iv. සියළුම සාමාජිකයන්ට කර්මාන්තයේ පවතින ගැටළු නිරාකරණයට අවශ්‍ය මගපෙන්වීම සඳහා අනුකමිටු 4ක දායකත්වය මගින් ක්‍රියාකාරී සේවයක් සැපයීම.

v. සියළුම සාමාජිකයන්ට සංගමයේ පාලිත කොන්දේසිවලට අනුකූලව නියෝජිත පිළිගැනීමක්, ප්‍රමිතිගත පිළිගැනීමත් සහ වෙළඳ අනුග්‍රහයක් ලබා දීමට කටයුතු කිරීම.

vi. කර්මාන්තයේ වෘත්තියභාවය සුරක්ෂිත කිරීම සඳහා චර්යා ධර්ම සංග්‍රහයක්/ ආචාර ධර්ම සංග්‍රහයක් භාවිතාවේ කේතයක් හඳුන්වා දීම

vii. කර්මාන්තයේ පවතින ගැටළු නිරාකරණය කිරීම සඳහා රාජ්‍ය ආයතන/ සාමාජික ආයතන, ව්‍යාපාරික සංගම්, ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සහ මාධ්‍ය කළමනාකරණය ඇතුළු සියළුම පාර්ශ්වයන් සමග ගනුදෙනු කිරීම සහ කාලීන අවශ්‍යතාවයන් වෙනුවෙන් පෙනී සිටීම.

viii. සංගමය දේශීය හා විදේශීය පිළිගැන්වීමට අවශ්‍ය නීතිමය හා ව්‍යුහාත්මක බලගැන්වීමකට ලක් කිරීම

ix. දේශීය හා විදේශීය වෙළඳපොළ ව්‍යාපාරික අවස්ථාවන් හඳුනා ගැනීම සහ ඒවා සපුරාගැනීමට සාමාජිකයන් දිරිගැන්වීම හා මග පෙන්වීම.

x. පානීය ජල බෝතල් පාරිභෝගිකයන් සුරක්ෂිත කිරීම, දැනුවත් කිරීම හා ප්‍රමිතිගත නොවන අනුකරණ භාවිතයේ අවදානම සහ අප කර්මාන්තය වෘත්තිය වෙනස සමාජගත කිරීම.

xi. කර්මාන්තයේ අනාගත නව විභවයන් හඳුනා ගැනීම හා ඉදිරිපත් කිරීම මගින් ලොකු කුඩා සියලුම සාමාජිකයින්ගේ ඉලක්ක වෙළඳපොළ ජයග්‍රහණයට අවශ්‍ය ආර්ථික මගපෙන්වීම හා සාර්ව ආර්ථික කාරණාවන් විශ්ලේෂණය.

xii. සියලුම සාමාජිකයන් අනන්‍ය වූ පිළිගැනීමකට ලක් කිරීම මගින් අමුද්‍රව්‍ය මිළදී ගැනීමේ සහ සත්‍යාපන ක්‍රියාවලියක් හඳුන්වා දී ප්‍රමිතිගත නොවන අනුකරණවලින් වෙළඳපොළ ආරක්ෂා කිරීමට මැදිහත් වීම.

xiii. අප සංගමයේ අනාගතය හා සජීකත්වය නීතිමය හා සාමාජීය බල ගැන්වීමකට ලක් කිරීමට තොරතුරු තාක්ෂණය හා අභ්‍යන්තර විගණනය මගින් පොදු ක්‍රියාවලියක් හඳුන්වාදීම හා සුරක්ෂණය කිරීම.

xiv. සංගමය ආර්ථික වශයෙන් සවිමත් කිරීම සඳහා මූල්‍ය මණ්ඩලයේ අනුමැතිය මගින් සමාජිය ආයතනයන්හි ප්‍රමිතිගත ඉලක්කයන් සපුරා දීම සඳහා මූල්‍ය හා තාක්ෂණික සහනයක් ලබාදීම.

xv. වාර්ෂික ප්‍රකාශනයක් මගින් අප කර්මාන්තය හා අදාළවන දැනට පවතින නීතිරීති හා රෙගුලාසි අණ පනත් හා අනෙකුත් කර්මාන්තයට බලපාන සාධකයන් විශ්ලේෂණය කිරීම.

2). ඉහත කී සමිතිය, සමිති ආඥාපනතේ 5(4) වගන්තියේ විධිවිධානවලින් නිදහස් කරමි.

**වසන්ත සමරසිංහ,**
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා,
සමුපකාර සංවර්ධන අමාත්‍ය.

2026 ක් වූ අප්‍රේල් මස 20 දින,
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය,
නො. 492,
එල් එච් පී ගොඩනැගිල්ල,
ආර් ඒ ද මෙල් මාවත,
කොළඹ 03.

EOG 04 - 0207/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.